# මී මැසි පාලනයෙන් ලාභ ලබන්නට නම්

"මියක් කඩන්නේ අත ලෙවකන්න නොවේ" යනුවෙන් අපේ භාෂාවේ පළපැදියම් වෙලා තිබෙන්නේ අප යම් දෙයක් කරන්නේ නම් එහි ප්‍රතිලාභයක් තිබිය යුතු බවයි අද ශ්‍රී ලංකාවේ මීමැසි පාලනයේ යෙදෙන්නන් හට තමන් ලබන ආයම වැඩි කරගන්නට සැලසුමක් ඇතිව මී පැණි ලබා ගන්නට උපදෙසක් දීමට මෙයින් බලාපොරොත්තු වේ.

අප පළතුරු ගසක් සිටවලා මහන්සි වෙලා වියදම් කරලා නඩත්තු කරලා නියම කාළයට අස්වැන්නක් ලබා ගනී. ඒ වගේම පැ වාරයට (වැඩියෙන් පැණි පුරවන කාළයට) ඉක්මනින් වැඩි පැණි ප්‍රමාණයක් ලබාගෙන ලාභ ලබන්නට නිවැරදිවම කළයුතු දේ දැනගෙන සිටීම අවශ්‍යයි මෙහිදී තමන්ගේ ප්‍රදේශවල මල් වලින් ගහණ කාලය කුමක්දැයි අවබෝධ කරගත යුතුයි පැණි වාරයට පෙර මීමැසි ජනපදයක් පැණි පිරවීමට සුදනම්කරන්නේ කෙසේ දැයි බලමු

(01) පැණි වාරය ආරම්භයේ අවම වශයෙන් පිලා පෙට්ටිය සමඟ තවත් පැණි පෙට්ටි 02ක් වත් පිරෙන සේ මී මැස්සන් පිරී සිටීමට කටයුතු කිරීම

(02) රංචු බෙදියාම සහ ජනපදය හැරයාම පාලනය කිරීම ඉතා වැදගත් වෙයි

මී මැසි ජනපදයක් අවුරුද්දේ මාස පහක පමණ කාලයක් ආහාර හිඟ අවධියක් ගත කරයි. මාස පහක් වර්ධන අවධියක් ගත කරයි. මාස එකක් හා දෙකක් අදික ලෙස පැණි රැස්කරන කාළයක් තිබේ. මෙම පැණි රැස්කරන කාලයේ (එහෙමත් නැතිනම් පැණි වාරයේ) අවශ්‍ය තරම් මී මැස්සන් ප්‍රමාණයක් සහ පැණි වද දෙකේදී උපරිම ප්‍රයෝජන ලැබීමට අනෙක් මාස දහය ඉතා සැලසුම් සහගතව දැනුවත්ව මීමැසි ජනපදය නඩත්තු කිරීම අවශ්‍ය වේ.

ඉහත වද (ඒ කියන්නේ පිලාවද) දෙකකින් පමණ ආරම්භ කරන අළුත් ජනපදයක් පැණි වාරය වන විට උපරිම හැකියාවක් ඇතිව මීපැණි නිෂ්පාදන තත්ත්වයට පත්කර ගන්නේ කෙසේ දැයි බලමු

01 පළමුව පිලා පෙට්ටියේ එක් පැත්තකට වද දෙක ස්ථානගත කරන්න.

02 එය ආසන්නයට තවත් හිස් වද රාමුවක් යොදන්න.

03 බෙදුම් ලෑල්ලක යොගෙන එම වද තුන වෙන්කරන්න.

04 ඝනාවාසය වැසෙන්නට හරින්න

හිස් වදරාමුවේ වදය බැඳීම ආරම්භ කර ඇත්නම් ජනපදය වර්ධනය වන බව තහවුරු කරගත හැකියි නමුත් එසේ වර්ධනය ආරම්භවීම ඉක්මන් කිරීමට කෘත්‍රිමව ආහාර සැපයීම කළ හැකිය මේ සඳහා උණුකර නිවාත් ජලය කොටස් 1 කට තිසි කොටස් 1ක් මිශ්‍රකර නොගැඹුරු භාජනයකට දමා පිලා පෙට්ටියට ඉහළින් තබන්න මේවා සවස් කාලයේ තබන්න (එසේ නොමැතිවිට තවමත් ජනපදය ශක්තිමත් නැති බැවින් අනෙක් ජනපදවල මැස්සන් මේ ආහාර සොරාගෙන යා හැකියි)

ජයලත් බණ්ඩාර
කථිකාචාර්ය
උද්‍යාන භෝග පුහුණු හා සංවර්ධන ආයතනය
බිබිල

05 අළුත් වදය භාගයක් පමණ වැඩුණු පසුව එම වදය පරණ වද දෙක අතරට යොදන්න.

06 තවත් හිස් වද රාමුවක් ගෙන පෙර පරිදි එම වදවල අයිනකින් තබා බෙදුම් ලෑල්ලක් මගින් වෙන් කරන්න.

07 කලින් ආකාරයට එම වදයත් භාගයක් පමණ වැඩුණු පසු එයද වද රාමු මැදින් යොදන්න.

08 මේ ආකාරයයට වද 4ක් දක්වා වැඩුණු විට අවශ්‍ය තරම් මීමැසි ප්‍රමාණයක් සිටින බැවින් නැවත වදයක් බැඳීමට හිස් රාමුවක් එම වැඩුනු වද 4 මැදින් යෙදිය හැකියි

09 මේ ආකාරයට පිලාවද පෙට්ටියේ වද 6ක් වන විට දෙපැත්තේ අයිනේ ඇති පරණම වදයක් ගෙන දෙනට කපා පැණි පෙට්ටියේ රාමු දෙකකට හරි මැදින් තබන්න.

10 නැවතත් අළුත් වදය භාගයක් පමණ වැඩුන විට හිස් රාමුවක් මැදට තබන්න අනෙක් පස අයිනේ ඇති වැඩුණු වදය ගෙන දෙකට කපා ඉහළින් ඇති පැණි පෙට්ටියට යොදන්න ඒවාද ඉහළින් හරි මැදින් යොදන්න.

මේ ආකාරයට පිලාවද 6ක් තබා ගනිමින් පළමු පැණි පෙට්ටිය පුරවන්න.

11 ඉන්පසු පිලාවද 7ක් දක්වා වර්ධනය කර ගනිමින් ඉහත අයුරින් දෙවන පැණි පෙට්ටියද සම්පූර්ණ කරන්න පළමු පැණි පෙට්ටියේ පැණි වද 2 වන පැණි පෙට්ටියට ගනිමින් පෙට්ටි පුරවන්න.

මේ සියළුම ක්‍රියාකරම් ජනපදයට අවම පීඩාවක්වන ලෙස සිදුකළයුතු අතර, ආරම්භයේ ඝනාවාසය කුඩා බැවින් දුම්ගැසීමක් අවශ්‍ය වන්නේද නැත. ආහාර සැපයුම මගින් වදයේ භාගයක් (50%) බැඳීමට ගතවන කාලය වෙනස්වන අතර, එය සතියක් හෝ සති 2ක් 3ක් විය හැකියි. සාමාන්‍යයෙන් වද 2ක ජනපදයක් වද 4ක ජනපදයක් වීමට සති 6ක් පමණ ගතවෙයි

කපා ඉහළ ඇති පැවද පෙට්ටියට දමන වද වල පැටවුන් සහ බිත්තර හෝ පැණි ඇතත්, ඒවා සැලකිල්ලට නොගෙන පැණි පෙට්ටියට යොදන්න.

මෙසේ නොකිරීමෙන් බොහෝ විට පිලාවද පෙට්ටිය පිරීයන අතර, තදබදය නිසා ජනපදයෙන් කොටසක් බෙදී ඉවත්ව යනවා සමහරවිට මුළු ජනපදයම හැරයනවා එයට හේතුව වන්නේ වද පරණ වනවිට රැජිණ ඒවායේ බිත්තර නොදමන බැවින්ය: රැජිණ බිත්තර දමන්නේ අළුත් වදවල බැවින් බිත්තර දමන්නට අළුත් වද බඳින්නට හිස් පිලාවද රාමු සැපයිය යුතු වෙනවා.

ශ්‍රී ලංකාවේ පැහැදිලිවම පැණි අධිකව ලැබෙන කලාප 2ක් තිබේ. ඒවා නම් රෙඩ්ගම් (යුකැලිප්ටස් කලාපය) ලෙස හඳුන්වන බණ්ඩාරවෙල ප්‍රදේශය සහ රබර් වගා කරන ප්‍රදේශයි.

රබර් ගස්වල පැණි තිබෙන්නේ අළුතින් හටගන්නා දළුවලයි රබර් වගා කරන ප්‍රදේශවල (බස්නාහිර සහ සබරගමු පළාත් වල) පැණි වාරය පවතින්නේ පෙබරවාරි සහ මාර්තු මාස වලයි. රෙඩ්ගම් (යුකැලිප්ටස්) කලාපයේ අගෝස්තු සහ සැප්තැම්බර් මාස වලයි.

පැණි වාරයට පෙර මාස 5ක් පමණ කාලයක් වර්ධන අවධිය ලෙස හඳුන්වනවා. මේ කාලයට මීමැස්සන්ගේ ගහණය ඉතා වැඩිවෙනවා. ඒ සමඟම පැණිවාරයට සති 4 කට පෙර ඉතා වේගයෙන් වර්ධනය වෙනවා. මේ කාලයේදී අධික වශයෙන් රංචු බෙදී යනවා. රංචු බෙදීයාමට එක් හේතුවක් වන්නේ පිලා පෙට්ටියේ ඇතිවන අධික ගහනය නිසා ඇතිවන තදබදයය.

මීමැසි ගහනයේ උෂ්නත්වය වැඩිවීම හා පිලා පෙට්ටියේ ඇති වද පැණි සහ පරාග වලින් පිරියාම නිසා රැජිණට බිත්තර දැමීමට ඉඩකඩ ඇහිරේ. මේ නිසා මීමැස්සන් යම්කිසි ප්‍රමාණයක් පිටවී යනවා. මී මැස්සන්ගෙන් 25% සිට 40% දක්වා ප්‍රමාණයක් රංචු බෙදීයාමත් සමඟ ඉවත්ව යයි. මේ නිසා පැණි අස්වැන්න අඩුවෙනවා.

පැණි වාරයේ ආරම්භය වනවිට නියම කාලයට වද පාලනය කරමින් අවම ලෙස දෙවන පැණි පෙට්ටියවත් මීමැස්සන්ගෙන් පුරවා තැබිය යුතුයි. එවිට පැණි වාරයේදී පැණි නිෂ්පාදනයට අවශ්‍ය උපරිම මීමැසි ප්‍රමාණයක් සිටින නිසා උපරිම පැණි ප්‍රමාණයක් නෙළාගත හැකිවෙනවා.

එත් එක්කම පැණිවාරයට පසුව බොහෝ ප්‍රදේශවල වර්ෂාව අධික සුළඟ අධික, ඉඩෝරය අධික කාලවල ආහාර හිඟය නිසා අහේනි තත්ත්වයක් පවතිනවා මේ කාලය වනවිට මීමැස්සන් ප්‍රමාණය අඩුවෙනවා මේ නිසා ඔවුනට අවශ්‍ය ආහාර ප්‍රමාණය අඩුයි මෙ නිසා එම කාලයේ මී මැස්සන් පිරී ඇති පිලාව ද 6ක් පමණ නඩත්තු කරමින් පැ වලින් හිස්ව ඇති පැ පෙට්ටි ඉවත් කරන්න එසේ නොකළ විට පරණ වද ඉටිසලබයාගේ හානියට ගොදුරු විය හැකියි මීමැස්සන් පිරී ඇති පිලාවද ප්‍රමාණය 6ට වඩා අඩුවෙයි නම් එම කාළය තුළ කෘත්‍රිම ආහාර සපයන්න

නැවතත් මාස 5කට පමණ පසු වර්ධන අවධිය ආරම්භ වෙනවා එම කාලයේදී නැවතත් ගහණය පාලනය කිරීමට කට්ටි බෙදා අළුත් ජනපද ඇති කරගත හැකියි ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය මහඉලුප්පල්ලම